# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

**පොදු කාර්යාලය**011-2868441, 2868442, 2868443
**பொது அலுவலகம்**
**ෆැක්ස් /தொலைநகல்:** 011-2868426
***website : www.elections.gov.lk***

**මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය**
**සරණ මාවත, රාජගිරිය.**(10107)
**தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்,**
***சரண மாவத்தை, இராஜகிரிய*** (10107)
***e-mail : info@elections.gov.lk***


මගේ අංකය : EC/P/LAE/2025/09 | ඔබේ අංකය : | දිනය : 2025.04.17
**எனது இல. :** | **உமது இல :** | **திகதி:**

**චක්‍රලේඛ අංක: LAE/2025 - 59**

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්/**
**පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් /**
**කොමිෂන් සභා ලේකම්වරු/ පොලිස්පති/ත්‍රිවිධ හමුදාපතිවරු/රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06**
**තැපෑලෙන් ඡන්දය දීම - තැපැල් ඡන්දය සලකුණු කිරීමේ සංශෝධිත දින වකවානු**

උක්ත කරුණ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කරන ලද මාගේ චක්‍රලේඛ හා උපදෙස් ලිපිවලට වැඩිමනත් වශයෙනි.

02. පළාත් පාලන ආයතන **339ක් සඳහා 2025.05.06** දින පැවැත්වෙන ඡන්ද විමසීමට අදාළව පළාත් පාලන ආයතන **227**ක් සඳහා **2025.04.07,10** හා **15** දිනවල තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කර ඇති අතර ඉතිරි පළාත් පාලන ආයතන **112** සඳහා **2025.04.21** දින තැපැල් ඡන්ද නිකුත් කිරීමට කටයුතු සංවිධානය කොට ඇත.

03. ඒ අනුව, එම පළාත් පාලන ආයතනවලට අදාළ තැපැල් ඡන්දහිමියන් සඳහා තැපැල් ඡන්ද ඇතුළත් රක්ෂණ පැකැට්ටු (D කවර) ඒ ඒ සහතික කිරීමේ නිලධාරීන් වෙත **2025.04.21** දින තැපෑලෙන් යවා අවසන් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කොට ඇත.

04. එබැවින්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව **තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින 2025.04.24,25,28 හා 29 ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් සංශෝධනය කර ඇති බව** ඔබ ආයතනයේ සියළුම සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

05. **2025.04.24 ,25** දිනවල දී සලකුණු කරනු ලබන තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු **"A"** කවර එදිනම තැපෑලට බාර දීමට කටයුතු කළ යුතු ය.

**06. 2025.04.28 හා 29 දිනවල සලකුණු කළ තැපැල් ඡන්ද ඇතුළත් පැකට්ටු (A කවර) සහ සලකුණු නොකොට ඉතිරිවන තැපැල් ඡන්ද ඇතුළත් පැකට්ටු (D කවර) මොනයම් හේතුවක් හෝ නිසාවෙන් සහතික කිරීමේ නිලධාරීන් විසින් තැපෑලට භාර දීම නොකළ යුතු අතර ඊට අදාළ ආකෘතිය සම්පූර්ණ කර සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත අතින් ගෙනවිත් භාර දීම හෝ තැපැල් ඡන්ද කටයුතු අධීක්ෂණය සඳහා පැමිණෙන සහකාර තේරීම්භාර නිලධාරී වෙත බාර දීම කළ යුතු ය.**

07. මේ පිළිබඳව ප්‍රමුඛ අවධානය යොමු කොට කටයුතු කරනු ඇතැයි උදක්ම විශ්වාස කරන අතර මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හි දී ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත්

| | | |
|---|---|---|
| 01. | ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව | කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 02. | සියළුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා | |
| 03. | සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්වෙත | |
| 04. | ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් | |


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி :011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
*e-mail : chairman@elections.gov.lk*
*e-mail : comelesl@sltnet.lk*

**මැතිවරණ කොමසාරිස් ජනරාල්**
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
**දුරකථන/தொலைபேசி**:011-2885207
**ෆැක්ස්/தொலைநகல்** :011-28**85208**
*e-mail: cge@elections.gov.lk*

**අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන)**
**பணிப்பாளர் (ஆராய்ச்சி மற்றும் திட்டமிடல்)**
දුරකථන/தொலைபேசி : 011-2877618
ෆැක්ස්/தொலைநகல : 011-2877618
*e-mail : channa@elections.gov.lk*